# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1503 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 02/12/2023<br>පැය 1545 |

## මාධ්‍ය නිවේදනය

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

### 01. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - එගොඩඋයන පොලිස් ස්ථානය.

2023.12.01 වන දින සවස් කාලයේ එගොඩඋයන පොලිස් වසමේ මෝදර ජාතික නිවාස ආසන්න ප්‍රදේශයේදී එගොඩඋයන පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 710 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු අවුරුදු 45 ක් වන මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** එගොඩඋයන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

### 02. දුම්රියේ ගැටී පුද්ගලයෙකු මිය යාමක් - වැල්ලවත්ත පොලිස් වසම.

2023.12.01 වන දින දහවල් කාලයේ වැල්ලවත්ත පොලිස් වසමට අයත් මුහුදුබඩ දුම්රිය මාර්ගයේදී පුද්ගලයෙකු දුම්රියේ ගැටී මියගොස් ඇති බවට ලද පණිවිඩයක් මත වැල්ලවත්ත පොලිසිය විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 57 ක් වන ඉන්දියානු ජාතිකයෙකි.**

මරණකරු සිය බිරිඳ සමඟ මුහුදුබඩ දුම්රිය මාර්ගයේ ගමන් කරමින් සිටියදී දෙහිවල දෙස සිට කොළඹ දෙසට ධාවනය වූ දුම්රියක මෙම පුද්ගලයා ගැටී බරපතල තුවාල ලබා කළුබෝවිල රෝහලට ඇතුළත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇති බවට විමර්ශනයේදි අනාවරණ වී ඇත.වැල්ලවත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**